කායවර්ධන ක්‍රීඩාවේ නියැලෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහාත්, ක්‍රියාශීලී ජීවන රටාවකට තරුණ පරපුර හුරු කිරීම සඳහාත් එළිමහන් ව්‍යායාම් හා කායවර්ධන මධ්‍යස්ථාන 500 ක් පිහිටුවීම සම්බන්ධයෙන් අරුණ (05/05) පුවත්පතේ ලිපියක් පළවී තිබිණි. කෙසේ වෙතත් මෙහි සිරස්තලය දැක්වී තිබුණේ "තරුණයන්ට ජවය දෙන්න කායවර්ධන මධ්‍යස්ථාන 500 ක් රට පුරා" යනුවෙනි!
මෙම පුවත සිලෝන් ටුඩේ පුවත්පතේ (05/05) ස්ත්‍රී පුරුෂ භාවයන් අදාළ වන සඳහන් කිරීම් වලින් තොරව, "Govt. to build 500 outdoor gyms" යන සිරස්තලයෙන් යුතුව පළ වී තිබිණි.
වර්තමානයේදී ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව බොහෝ දෙනෙකු ව්‍යායාම් සඳහා කායවර්ධන මධ්‍යස්ථානයන්ට පැමිණෙන අතර, පුරුෂ පක්ෂයේ මෙන්ම කාන්තා පක්ෂයේ බොහෝ දෙනෙකුද කායවර්ධන ක්‍රීඩාවේ නියැළෙයි. එවැනි පසුතලයකදී මෙම අරුණ සිරස්තලය ඔස්සේ "තරුණයන්ට" පමණක් "ජවය ලබාදීම" කෙතරම් යෝග්‍ය වේද?
මෙය සිරස්තල යෙදීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයක් විය හැකි වුවත්, ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ වක්‍රාකාරීව හෝ සිදුවන වෙනස්කම් වැළැක්වීම සඳහා පෙන්වා දිය යුතු කරුණක් යැයි අපි සිතමු.
#MediaEthicsSL #lka #SinhalaPress #CeylonToday #Aruna